සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2017
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- **පහත සඳහන් සංවාද හා කවි ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 01 සිට 07 දක්වා පිළිතුරු සපයන්න.**

(a) යකදුරෙක් - කොහෙද යන්නෙ
යකෂණිය - මං යන්නේ ඉස්පිරිතාලෙට
මාව බාර ගන්න කියන්න මහත්තයට...

(b) වඩිග පුර දේසෙන් - සත් දෙන බමුණු ඇවිදින්
කළ වඩිග පටුනෙන් - මෙසේ බමුණෝ යාග කරමින්

(c) රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දැකා මෙන් නෙත් රැවිය මට
ඇදුරු මරු දකා නර බිල්ල ගන්නට
පැදුර පිට තැබුවා යකුට කන්නට

(d) බමුණා - මේ මනුස්සානං ලංකා දොරටු බාසං නත්ථි
ඇදුරා - (ගෙය දෙසට හැරී එහි වාඩි වී සිටින අයට)
ඔන්න ඕයි දොර මුල්ලෙන් අයින් වෙන්නලු

(e) ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා
සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා
පත්තිනි දෙවිදුගෙ කෝවිල ගාවා
අපිත් කෙලිමු ලී සබ මැද බෝවා

(f) උඩින් උඩින් උඩු නුවරින් ගෙනාවා
බිමින් බිමින් බිම් තැන්නෙන් ගෙනාවා
කපා කොටා ලියවාලා ගෙනාවා

(01) ඉහත සංවාද ඛණ්ඩ අතරින් 'a' අක්ෂරයෙන් දක්වා ඇති සංවාද ඛණ්ඩය අයත් වන ශාන්ති කර්මය කුමක් ද?
(1) රට යකුම යි.
(2) සන්නි යකුමයි.
(3) සූනියම් යාගය යි.
(4) මඩු ශාන්ති කර්මය යි.

(02) මහා සම්මත රජ හා සම්බන්ධ ශාන්ති කර්මයකට අයත් කවි/දෙබස් ඛණ්ඩ දෙකක් වන්නේ මින් කුමක් ද?

(1) a හා e (2) c හා d (3) a හා c (4) d හා f

(03) "නෘත්ත" ගණයට අයත් කවියක් අඩංගු වරණය වන්නේ,

(1) a (2) c (3) e (4) f

(04) පහතරට සම්ප්‍රදායට අයත් කාන්තාවන් වෙනුවෙන් ම පවත්වන ශාන්ති කර්මයකට අයත් කවියක් ඇතුළත් වරණය වන්නේ කුමක් ද?

(1) a (2) c (3) e (4) f

(05) "a" සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යමය පෙළපාලිය කුමක් ද?

(1) නානු මුරය යි. (2) සූනියම් යක්ෂණියගේ වේෂත්‍රය යි.
(3) කපු යක්කාරිය ය. (4) වඩිග පටුනයි.

(06) "f" අක්ෂරයෙන් දැක්වෙන කවිය ඇතුළත් ශාන්ති කර්මය වන්නේ කුමක් ද?

(1) රට යකුම යි. (2) සූනියම් යාගය යි.
(3) මඩු ශාන්ති කර්මය යි. (4) සන්නි යකුම යි.

(07) "ලෙඩ රෝග ප්‍රධානව" පැවැත්වෙන ශාන්ති කර්මයක අන්තර්ගත කවි ගායනාවක් ඇතුළත් වරණය වන්නේ මින් කුමක් ද?

(1) b (2) c (3) e (4) f

- ප්‍රශ්න අංක 08 සිට 13 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

(08) "ස්වභාවික චලන" යනු කුමක් ද?

(1) කිසියම් සම්ප්‍රදායකට අනුව කරනු ලබන චලන ය
(2) අනුකරණය කරමින් කරනු ලබන චලන ය
(3) රිද්මයකට අනුව කරනු ලබන චලන ය
(4) ආයාසයකින් තොරව කරනු ලබන චලන ය

(09) නාට්‍ය කලාවේ මූලික අරමුණ දැක්වෙන වරණය කුමක් ද?

(1) පණිවිඩයක් දීමයි (2) සෞන්දර්යාත්මක වින්දනයක් ලබා දීමයි.
(3) මුල මැද අග ගැලපීමයි (4) හාස්‍ය රසය මතු කිරීමයි

(10) "ආනුෂංගික" කලා ශිල්ප ඇතුළත් වරණය වනුයේ කුමක් ද?

(1) රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, පසුතල රංගාලෝකය
(2) රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, පිටපත, රංගාලෝකය
(3) රංග වස්ත්‍ර, පසුතල, අභිනය, රංග භාණ්ඩ
(4) වේදිකාව, නාට්‍ය පිටපත, රංගාලෝකය, පසුතල

(11) "තරුණ රංගන ශිල්පියෙකු මහල්ලෙකුගේ චරිතයක් සඳහා අංග රචනා කරනු ලබයි" මේ සඳහා යොදා ගනු ලබන්නේ මින් කුමන අංග රචනා ක්‍රමය ද?

(1) විකාර රූපී අංග රචනය යි. (2) සරල අංග රචනය යි.
(3) චරිතාංග අංග රචනය යි. (4) ශෛලිගත අංග රචනය යි.

(12) වේදිකා නාට්‍යයක රඟ පැවැත්ම වඩාත් තීරණය වන සාධකය කුමක් ද?
(1) නාට්‍ය සංගීතය යි.
(2) ප්‍රේක්ෂක ප්‍රතිචාරය යි.
(3) නළු - නිළියන් ය.
(4) අධ්‍යක්ෂවරයා ය.

(13) රංග භූමිය ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් ගණන
(1) 6කි. (2) 9කි. (3) 5කි. (4) 7කි.

- ප්‍රශ්න අංක 14 සිට 20 දක්වා පහත වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| ක | ච | ට | ත |
|---|---|---|---|
| ජනේලය | පුස්ලෝඩං | තට්ටු ගෙවල් | අන්දර මල් |
| කුවේණි | සුභ සහ යස | බෝඩිංකාරයෝ | සීතාම්බර පට |
| අහස් මාලිගා | සුදු සහ කළු | මරාසාද් | චරන්දාස් |
| හුණුවටයේ කතාව | පණ්ඩුකාභය | නන්දි විසාල | මකර රාක්ෂ |

(14) "ජන කරළිය" මගින් නිර්මාණය කළ නාට්‍ය ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) "ක" කාණ්ඩය (2) "ච" කාණ්ඩය
(3) "ට" කාණ්ඩය (4) "ත" කාණ්ඩය

(15) සොඳුරු ආඥාදායකයා කෘතිය රචනා කළ නාට්‍යකරුවාගේ නාට්‍ය ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) "ක" කාණ්ඩය (2) "ච" කාණ්ඩය
(3) "ට" කාණ්ඩය (4) "ත" කාණ්ඩය

(16) "ක" කාණ්ඩය ඇතුලත් නාට්‍ය අධ්‍යක්ෂණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) සුගතපාල ද සිල්වා විසිනි
(2) හෙන්රි ජයසේන විසිනි
(3) මහාචාර්ය සරත්චන්ද්‍ර විසිනි
(4) ශ්‍රියන්ත මෙන්ඩිස් විසිනි

(17) ඉන්දීය නාට්‍ය පරිවර්තනයක් ඇතුළත් කාණ්ඩය වන්නේ කුමක් ද?
(1) "ක" කාණ්ඩය (2) "ඛ" කාණ්ඩය
(3) "ට" කාණ්ඩය (4) "ත" කාණ්ඩය

(18) "ජන කරළිය" නාට්‍ය කණ්ඩායම නිර්මාණය කළ නාට්‍ය කරුවන් කවුරුන් ද?
(1) එච්. ඒ. පෙරේරා හා මානෙල් ජයසේනයන් ය.
(2) හෙන්රි ජයසේන හා ජැක්සන් ඇන්තනී ය.
(3) සයිමන් නවගත්තේගම හා කෞශල්‍යා ප්‍රනාන්දුය.
(4) පරාක්‍රම නිරිඇල්ල හා එච්. ඒ පෙරේරා ය.

(19) ටෙනසි විලියම්ගේ "ද ග්ලාස් මෙනාජරි" නාට්‍යයේ පරිවර්තන නාට්‍ය වන්නේ,
(1) හුණුවටයේ කතාව (2) අහස් මාලිගා
(3) සුදු සහ කළු (4) චරන්දාස්

(20) "ස්වතන්ත්‍ර නාට්‍ය" පමණක් අඩංගු කාණ්ඩය වන්නේ මින් කුමක් ද?
(1) "ක" කාණ්ඩය (2) "ච" කාණ්ඩය (3) "ට" කාණ්ඩය (4) "ත" කාණ්ඩය

(21) "වේදිකා නාට්‍යයක්" යනු කුමක් ද?
(1) ඒකල ප්‍රයත්නයක යහපත් ප්‍රතිඵලයකි. (2) සජීවී කලාවකි.
(3) පිටපත් රචකයාගේ කලාවකි. (4) ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ගොඩ නැගෙන්නකි.

(22) නාට්‍යයේ සාහිත්‍යමය කොටස ලෙස සලකන්නේ කුමක් ද?
(1) ඇඳුම් පැළඳුම් ය. (2) අංග රචනය ය.
(3) පිටපත ය. (4) ආලෝකය ය.

(23) "රංග විධාන" අවශ්‍ය වන්නේ කවුරුන් සඳහා ද?
(1) ප්‍රේක්ෂකයන්ට ය. (2) නළුවන්ට ය.
(3) ආනුෂංගික ශිල්පීන්ට ය. (4) නාට්‍ය විචාරකයින්ට ය.

(24) ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා මාධ්‍යයක් නොවන්නේ කුමක් ද?
(1) ගුවන් විදුලි මාධ්‍යය යි. (2) වේදිකා නාට්‍යය යි.
(3) රූපවාහිනී නාට්‍යය යි. (4) වීදි නාට්‍යය යි.

(25) නළුවකු තම ස්වභාවය අතහැර අන් වේෂයකට පත් වීම හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) අනුකරණය යි. (2) සමාරෝපය යි.
(3) චරිතායනය යි. (4) අභිරූපණය යි.

(26) ශෛලිගත (නාට්‍ය ධර්මී) නාට්‍යයක පසුබිම විස්තර කරන්නේ කුමකින් ද?
(1) පසුතල නිර්මාණවලිනි. (2) ගීත, කවි, කාව්‍යමය සංවාද මගිනි.
(3) සංගීතය මගිනි. (4) තිර භාවිතයෙනි.

(27) නාට්‍යයක් නිෂ්පාදනය සඳහා මුදල් යොදවන්නා හඳුන්වන්නේ,
(1) අධ්‍යක්ෂ වශයෙනි.
(2) අර්ථපති වශයෙනි.
(3) පෙළ රචකයා වශයෙනි.
(4) වේදිකා පරිපාලක වශයෙනි.

(28) අංග රචනයේ දී "රිමූවින් ක්‍රීම්" (Removing Cream) භාවිතා කරන්නේ කුමක් සඳහා ද?
(1) හැඩතල මතු කිරීමට ය.
(2) මුහුනේ මේක්අප් (Make up) ඉවත් කිරීමට ය.
(3) රැවුල් ඇලවීමට ය.
(4) දත් වර්ණ ගැන්වීමට ය.

(29) ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීමට යාමේ දී,
(1) වාචික අභිනය භාවිතා නොකරයි.
(2) පිටපතක් අවශ්‍ය වේ.
(3) තමාගේ නිර්මාණාත්මක බව ප්‍රදර්ශනය කරයි.
(4) දිගු කාලීන පුහුණුවක් අවශ්‍ය වේ.

(30) ශෛලිගත සම්ප්‍රදායේ නාට්‍යයක් වන "සිංහබාහු" නාට්‍යය කාගේ නිෂ්පාදනයක් ද?

(1) ගුණසේන ගලප්පත්තිගේ ය.
(2) මහාචාර්ය සරත්චන්ද්‍රයන්ගේ ය.
(3) සුගතපාලද සිල්වාගේ ය.
(4) බන්දුල ජයවර්ධනයන්ගේ ය.

(31) පහත සඳහන් කියමන්වලින් ප්‍රේක්ෂකයා පිළිබඳව ඇති නිවැරදි කියමන වන්නේ කුමක් ද?

(1) ප්‍රේක්ෂකයා රසිකයෙක් මෙන්ම හොඳ නළුවෙක් වීමය.
(2) ප්‍රේක්ෂකයා රසිකයෙක් මෙන්ම හොඳ ප්‍රේක්ෂකයෙකු වීමය.
(3) ප්‍රේක්ෂකයා රසිකයෙක් මෙන්ම හොඳ විචාරකයෙකු වීමය.
(4) ප්‍රේක්ෂකයා රසිකයෙක් මෙන්ම හොඳ සහෘදයෙක් වීමය.

(32) වර්තමානයේ බහුලව දක්නට ලැබෙන නාට්‍ය රඟ දක්වන වේදිකාව වනුයේ,

(1) ප්‍රොසීනියම් වේදිකාව
(2) කැරකෙන වේදිකාව
(3) රවුම් වේදිකාව
(4) ත්‍රිකෝණාකාර වේදිකාව

(33) යම්කිසි පුද්ගලයෙකු තුල ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ඇති වන්නේ කුමකින් ද?

(1) අභිරූපණය තුලිනි
(2) ක්ෂණික නිරූපණ තුලිනි
(3) භූමිකා රංගන තුලිනි
(4) රූපණය තුලිනි

(34) නාට්‍ය සංගීතය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි කියමන කුමක් ද?

(1) සෑම නාට්‍යයකට ම සංගීතය අවශ්‍යම අංගයකි.
(2) නාට්‍යයකට සංගීතය යොදා ගැනීමේ දී තේමාවට හානි නොවන පරිදි යොදා ගැනීම වැදගත් ය.
(3) සෑම නාට්‍යයකටම සංගීතය අවශ්‍ය නොවේ.
(4) නාට්‍යයක නළුවාගේ රංගනයට වඩා සංගීතය මතු කර දක්විය යුතුය.

- ප්‍රශ්න අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



ක    ග    ජ    ට    ඩ

(35) 1969 වර්ෂයේ දී "හිත හොඳ අම්මණ්ඩි" නම් නාට්‍ය නිෂ්පාදනය කලේ කවුරුන් විසින් ද?

(1) "ක" ය. (2) "ග" ය. (3) "ට" ය. (4) "ඩ" ය.

(36) "විනිශ්චය" නම් නාට්‍යය නිෂ්පාදනය කරනු ලැබුයේ,

(1) "ග" ය. (2) "ජ" ය. (3) "ට" ය. (4) "ඩ" ය.

(37) වංශ කතාවක් ඇසුරින් "සුභ සහ යස" නාට්‍යය නිෂ්පාදනය කරනු ලැබුයේ,

(1) "ග" ය. (2) "ජ" ය. (3) "ට" ය. (4) "ඩ" ය.

(38) නාට්‍යය, සිනමාව, ටෙලි නාට්‍ය යන මාධ්‍ය තුනෙහිම කැපී පෙනෙන ශිල්පීන් දෙදෙනෙකු වන්නේ,

(1) "ක" සහ "ඩ" ය.
(2) "ජ" සහ "ට" ය.
(3) "ක" සහ "ට" ය.
(4) "ට" සහ "ඩ" ය.

(39) එව්ගිනි ෂ්වාට්ස්ගේ ''ද ඩ්‍රැගන්'' නම් පරිවර්තන නාට්‍ය ඇසුරින් ලංකාවේ වේදිකාවට නාට්‍යයක් නිර්මාණ කරන ලද්දේ,

(1) ''ග'' ය. (2) ''ට'' ය. (3) ''ජ'' ය. (4) ''ඩ'' ය.

(40) මහාචාර්ය සරත්චන්ද්‍රයන්ගේ ''ප්‍රේමතෝ ජායතී ශෝකෝ'' නාට්‍ය සඳහා රංගනයෙන් දායක වන ලද්දේ,

(1) ''ග'' ය. (2) ''ජ'' ය. (3) ''ට'' ය. (4) ''ඩ'' ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04ක් ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(01) දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) මෙම නාට්‍යයේ රචකයා නම් කරන්න. (ලකුණු 02)
(2) මෙම නාට්‍යය අයත් ශෛලිය කුමක් ද? (ලකුණු 02)
(3) එම නාට්‍ය ශෛලියේ විශේෂ ලක්ෂණ 02ක් ලියන්න. (ලකුණු 02)
(4) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිත 03ක් නම් කරන්න. (ලකුණු 02)
(5) මෙම නාට්‍යයේ පසුබිම් සංගීතය සඳහා යොදා ගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න. (ලකුණු 02)
(6) දික්තල කාලගෝල නාට්‍යයේ ඇතුලත් ගීතයක මුල් කොටස ලියන්න. (ලකුණු 02)

(02) (1) නෘත්ත යනු කුමක් ද? (ලකුණු 02)
(2) නෘත්ත යන්න නෘත්‍යයෙන් වෙනස් වන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 04)
(3) "නාට්‍ය යනු බොහෝ කලා ශිල්පීන්ගේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි" විමසන්න. (ලකුණු 06)

(03) (1) රූපණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)
(2) රූපණ ශිල්පියෙකු සතු ගුණාංග 04ක් නම් කරන්න. (ලකුණු 04)
(3) අනුකරණය හා සමාරෝපය රූපණයේ දී වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(04) (1) ආනුෂංගික කලා ශිල්ප යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)
(2) නාට්‍යයට යොදා ගන්නා ආනුෂංගික කලා ශිල්ප 04ක් නම් කරන්න. (ලකුණු 04)
(3) ඉන් ආනුෂංගික කලා ශිල්ප දෙකක් නාට්‍යයේ සාර්ථකත්වයට වැදගත් වන්නේ කුමන ආකාරයෙන්දැයි විස්තර කරන්න. (1කට ලකුණු 03 බැගින් ලකුණු 06)

(05) (1) ඔබ දන්නා රංග අභ්‍යාස 03ක් නම් කරන්න. (ලකුණු 03)
(2) ඉහත ඔබ දැක් වූ එක් රංග අභ්‍යාසයක් සිදුකරන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 03)
(3) නළුවාගේ රූපණ හැකියාව වර්ධනය වීමට රංග අභ්‍යාස උපකාරී වන ආකාරය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(06) (1) කතන්දරයක් යනු කුමක් ද? (ලකුණු 03)
(2) කතන්දරයක හා නාට්‍යයක දැකිය හැකි වෙනස්කම් 03ක් ලියන්න. (ලකුණු 03)
(3) නාට්‍ය කලාවේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ පිළිබඳව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කථා සැකිල්ල ඔබ කැමැති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

එක් නරියෙක් කැලෑවක ඇවිදිමින් යනවිට මහත් වෙහෙසකට පත්විය. නරියාට හොඳටම බඩගින්නක් ඇති වී කෑමට යමක් හොයමින් කැලෑව ඇතුලට රිංගුවේ ය. කැලෑව ඇතුලින් කොටියෙකුගේ විලාපයක් නරියාට ඇසිණි. නරියා විමසිල්ලෙන් බලමින් යනවිට වලක වැටී සිටි කොටියකු දැක්කේ ය. කොටියා ඌව ගොඩට ගන්නා ලෙස නරියාගෙන් අයැද සිටියේ ය........ එතැන් සිට

(1) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)

(2) සංවාද, රංග විධාන සහිතව වේදිකාවට ගැලපෙන පරිදි පෙළ නිර්මාණය සඳහා (ලකුණු 08)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | ප්‍රායෝගික පරීක්ෂණය |

සැලකිය යුතුයි:

- මෙම ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රය ඇගයීම් අංක 06කින් සමන්විත වන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 40% වනසේ අවසාන ලකුණු ගණනය විය යුතුය. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මුළු ලකුණු ගණන 100කි.

## ඇගයීම 01

පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)

- ලෝක ධර්මී සංවාද සහිත පෙළකින් සහ නාට්‍ය ධර්මී සංවාද පෙළක් ඇසුරෙන් මෙම ඇගයීම සිදු කරනු ලැබේ.
  - (1) ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ පුහුණු වී පැමිණෙන දික්තල කාලගෝල නාට්‍යයෙන් කොටසක්
  - (2) ගුරුවරයා විසින් තෝරා දෙනු ලබන "කැලණි පාලම" නාට්‍යයෙන් කොටසක් (එක් කොටසකට විනාඩි 02 බැගින් විනාඩි 04)

- ශිෂ්‍යයා විසින් පෙර පුහුණු වී පැමිණෙන සංවාද කොටසට ලකුණු 20ක් හා ගුරුවරයා විසින් ලබාදෙන කොටසට ලකුණු 20ක් වශයෙන් ලකුණු 40 ප්‍රදානය කර, 40 දෙකෙන් බෙදා සුදුසු ලකුණු ලබාදෙන්න.
  - (1) කටහඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය = 5
  - (2) චරිතය හා අවස්ථාවට අනුකූලවීම = 5
  - (3) භාවාත්මක නිරූපණය = 5
  - (4) ශාරීරික ප්‍රකාශනය = 5

  20

## ඇගයීම 02

ක්ෂණික නිරූපණය (කේවල)

- විනාඩි 3ක උපරිම කාලයක් ලබා දිය යුතුය. මෙහිදී ලබාදී ඇති මාතෘකා ගුරුවරයා විසින් සුදුසු නාට්‍යානුසාරී සිදුවීමක් ගොඩ නැංවිය හැකි ලෙසින් යම් බඳු වෙනස්වීමක් සිදුකර දිය යුතුය.
  - (1) දේශපාලනඥයෙකු ඡන්දදායකයන් ඇමතීම.
    (මෙහිදී පරාජිත දේශපාලනඥයෙකු, ඡන්දය දිනූ දේශපාලනඥයෙකු ආදී වශයෙන් වෙනස්කර දිය යුතුය.
  - (2) සුපිරි තරුවක් වීමට සිහින දකිමින් සිටින විට.
  - (3) විදේශ රටක අතරමං වීම.
  - (4) සුපිරි වෙළඳසැලක භාණ්ඩ සොරකම් කර අසුවීම.

(5) මධ්‍යම රාත්‍රී කාලයේ විදුලිය නොමැති දුම්රිය ස්ථානයක තනි වීම.

| | | |
|---|---|---|
| (i) | නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීම | = 5 |
| (ii) | කටහඬ හඬ ප්‍රක්ෂේපණය උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම | = 5 |
| (iii) | ශාරීරික ප්‍රකාශනය සහිත වීම. | = 5 |
| | | 15 |

<u>ඇගයීම 03</u>

කෙටි නාට්‍ය නිෂ්පාදනය (සාමූහික)
කාලය විනාඩි 06 - 08 අතර වේ.

- පන්ති කාමරයේ නිර්මාණය කරනු ලැබූ කණ්ඩායම් ක්‍රියාකාරකමක් වන අතර නාට්‍ය පෙළක් සහිත විය යුතුය.
  මෙම කණ්ඩායම් ඇගයීමට අපේක්ෂකයන් 04 - 07 පමණක් වේ.
  නාට්‍යෝපකරණ වේශ භූෂණ සංගීතය භාවිතයට ඉඩ ඇත.

| | | |
|---|---|---|
| (1) | නාට්‍ය පිටපත (සිදුවීම් අවස්ථාවන්, සංවාද චරිත | = 5 |
| (2) | ශාරීරික ප්‍රකාශනය සහ භාවිතය | = 5 |
| (3) | වේෂ භූෂණ නාට්‍යෝපකරණ සරල පසුතල රංග රචනය සහ සංගීතය | = 5 |
| (4) | කණ්ඩායම් සාමූහිකත්වය හා රංග රචනය, සංගීතය | = 5 |
| | | 20 |

<u>ඇගයීම 04</u>

නාට්‍ය ගීතය (කේවල)

- අපේක්ෂකයා අභිමත ඕනෑම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් සිදු කරන්නකි.
  කාලය විනාඩි 03කි.
  නාඩගම් සම්ප්‍රදායේ සිට නූතන යුගය දක්වා ඕනෑම නාට්‍ය සම්ප්‍රදායකින්/ ශෛලියකින් තෝරාගත් නාට්‍ය ගීතයක් විය යුතුය. මුවින් ගායනා කරන ගීතයක් විය යුතු අතර පසුබිමේ ගීතයක් නොවිය යුතුය.

| | | |
|---|---|---|
| (1) | සංගීතාත්මක බව හඬ පාලනය හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | = 5 |
| (2) | මනෝභාවික අන්තර්ගතය | = 5 |
| (3) | ශාරීරික ප්‍රකාශනය | = 5 |
| | | 15 |

<u>ඇගයීම 05</u>

නිර්මාණාත්මක රංග රචනය (සාමූහික)
කාලය විනාඩි 02 - 06 විය යුතුය.

- සංගීත හඬ පටයක් අනුව වාචික අභිනයෙන් තොර ඉදිරිපත් කිරීමකි. අපේක්ෂක සංඛ්‍යාව 3 - 5 අතර වේ. රංග රචනය කේන්ද්‍රවන අතර හුදු නර්තනයෙන් ඔබ්බට ගොස් සිදු කරනු ලබන නාට්‍යමය ඉදිරිපත් කිරීමකි. සංගීත ඛණ්ඩ (අධ්‍යාපන අමාත්‍යාංශයේ) අන්තර්ජාලයේ ප්‍රසිද්ධ කරන ලද සංගීත ඛණ්ඩයන්ගෙන් එකක් විය යුතුය.

(1) සංගීත ඛණ්ඩයේ සුවිශේෂ ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම හා අර්ථකතනය = 5
(2) මනෝභාවික අන්තර්ගතය = 5
(3) ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය = 5

15

## ඇගයීම 06

කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම.
කාලය විනාඩි 3 - 5 විය යුතුය.

- අපේක්ෂකයා තෝරාගත් සාම්ප්‍රදායික හෝ දෙස් විදෙස් ජනකතා, සුරංගනා කතා, උපමාකතා හෝ වෙනත් සුදුසු කතාවකි.
  නාට්‍යෝපකරණ වේෂ භූෂණ මෙන්ම ස්ථානීය වශයෙන් භාවිත කළ හැකි පසුතල භාවිතයට ඉඩ දෙන්න. ඇතැම්විට සංගීතය, ශබ්ද සංයෝජනය රූකඩ භාවිතය වැනි දේ යොදා ගැනීම ගැටළුවක් නොවේ.

(1) කතන්දරය තෝරා ගැනීම. ඒ පිළිබඳව අවබෝධය = 5
(2) කටහඬ, හඬ ප්‍රක්ෂේපනය = 5
උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම
(3) ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය = 5

15